මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/18/10/12-I

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.08. 20

චක්‍රලේඛ අංක : 28/2024

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත්/කලාප විශේෂ අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත්/කලාප ප්‍රාථමික අධ්‍යාපන නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්/ගුරු විද්‍යාල විද්‍යාලපතිවරුන්,
සියලු ම රජයේ විද්‍යාලවල විදුහල්පතිවරුන්, විශේෂ/ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන්,
සියලු ම රජයේ අනුමත පෞද්ගලික විදුහල්වල හා උපකෘත විශේෂ විදුහල්වල විදුහල්පතිවරුන් වෙත,
සියලු ම උපකෘත පාසල්වල කළමනාකරුවන් වෙත,

**<u>උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපනය තහවුරුව සඳහා චක්‍රලේඛය</u>**

1.0 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥාපනත සහ එහි සංශෝධන අනුව එහි v කොටසේ 37 රෙගුලාසිය සහ විශේෂයෙන් එහි iii විශේෂ පාසල් (a) වගන්තිය අනුව රෙගුලාසි පැනවීම සඳහා ගරු අධ්‍යාපන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව උපකෘත විශේෂ පාසල්වල පාලනය සඳහා පනවා ඇති ඉංග්‍රීසි උපකෘත පාසල් ව්‍යවස්ථා මාලාවට අමතර ව උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපනය තහවුරුව සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසට ගරු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මා වෙත බලය පවරා ඇත. ඒ අනුව, එම බලය පැවරීම ප්‍රකාරව උපකෘත විශේෂ පාසල්හි ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කිරීමට පියවර ගැනීම උදෙසා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා සැලසීමේ දී උපකෘත විශේෂ පාසල් සඳහා සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. ළමයින්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම, ළමයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය, ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනීම ඒ අතර ප්‍රධාන වේ. උපකෘත විශේෂ පාසල්හි කළමනාකරුවන්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් එම කාර්යයන්හි ඵලදායි ලෙස කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා, අවශ්‍ය ක්‍රමවේද සැකසීම සඳහාත්, අවශ්‍ය මඟපෙන්වීම සහ නියාමන කාර්ය සඳහාත්, අධ්‍යාපනික ආයතන සහ අදාළ නිලධාරීන්ට අවශ්‍ය බලය පැවරීම සඳහාත් මෙම චක්‍රලේඛය මාර්ගෝපදේශ සපයනු ලබයි.

**2.0 උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා පාසල් මට්ටමේ කාර්යභාරය**

2.1 සෑම උපකෘත විශේෂ පාසලකම පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුභවතුන් නියෝජනය වන පරිදි සැලසුම් කමිටුවක් පත් කර ගත යුතු ය.

2.2 එම සැලසුම් කමිටුව විසින් පාසලේ සංවර්ධනය සඳහා පස් අවුරුදු පෙරලුම් සැලසුමක් සකස් කළ යුතු ය.

2.3 එම පස් අවුරුදු පෙරලුම් සැලැස්ම අනුව වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ වාර්ෂික ලිත සකස් කළ යුතු ය.



CamScanner

2.16 පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලියට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "අපේ පාසල කොතරම් ගුණාත්මක ද?" නම් තේමාව යටතේ නිකුත් කරන ලද අංක 31/2014 හා 2014.12.02 දැනැති චක්‍රලේඛයට අනුගතව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.

2.17 උක්ත 2.16 සඳහන් චක්‍රලේඛයට අනුගතව ක්‍රියාකිරීමේ දී පසලේ ගුරු මණ්ඩලය චක්‍රලේඛයේ සඳහන් ඇගයීම් ක්ෂේත්‍ර සඳහා කමිටුවල පත් කළ යුතු ය. පාසලේ සිටින ගුරුවරුන් සංඛ්‍යාව අනුව එක් ක්ෂේත්‍රයක අදාළ කමිටුවකට නම් කරන ගුරුවරුන් සංඛ්‍යාව තීරණය කළ යුතු අතර එක් එක් ක්ෂේත්‍ර සඳහා කමිටු ප්‍රධානියකු පත් කළ යුතු ය.

2.18 විදුහල්පති විසින් පාසලේ අභ්‍යන්තර ඇගයීම් වැඩසටහන් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. ඒ සඳහා අභ්‍යන්තර අධීක්ෂණ කමිටුවක් පාසලේ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන්ගෙන් පත්කර ගත යුතු ය.

2.19 පාසලේ විනය පවත්වාගෙන යාම සඳහා විනය කමිටුවක් පත් කිරීම, මේ පිළිබඳ වාර්තා පවත්වා ගැනීම සිදු කළ යුතු ය. උපදේශනය හා මාර්ගෝපදේශනය සඳහා ගුරුභවතෙක් පත්කර පාසල් මට්ටමේ උපදේශක හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු ය.

2.20 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් බුද්ධි ඌනතා සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සකස් කරන ලද "අන්තර්කරණ අධ්‍යාපනය කරා..... ගුරු මාර්ගෝපදේශ ii" ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු අතර උපරිම වසර 02ක් අවසානයේ දී එම සිසුන් සඳහා සාමාන්‍ය විෂය මාලාව ක්‍රියාත්මක කළ යුතු ය.

2.21 වාරයකට අවම එක් වතාවක් හෝ පන්ති මට්ටමේ තත්ත්ව කව සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම, ඒවායෙහි වාර්තා තබා ගැනීම ගුරු භවතුන් විසින් කළ යුතු ය.

2.22 ගුරු භවතුන් විසින් පාසලෙන් පරිබාහිරව ආයතන වෙත සෘජුව ලිඛිත ව ලිපි ලිවීම හෝ මාධ්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම කළ නො හැකි අතර අදාළ විදුහල්පති / කළමනාකරු මගින් ලිපි ලිවිය යුතු අතර ආයතන ප්‍රධානියාගේ අවසරයකින් තොරව මාධ්‍ය වෙත ප්‍රකාශ ලබාදිය නොහැකි ය.

2.23 විදුහල්පතිවරයා විසින් පාසලේ ගුරුභවතුන්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය, නාමලේඛනය, කෙටි නිවාඩු, වරු නිවාඩු, ප්‍රමාද වී පැමිණීම සහ නිවාඩු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. ශිෂ්‍ය පැමිණීමේ ලේඛන ඇසුරෙන් වාර්ෂික වාර්තා පිළියෙල කර කලාප අධ්‍යාපන කාර්යාලය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව වෙත එවිය යුතු ය. පාසලට ලැබෙන සියලු භාණ්ඩ සහ උපකරණ තොග පොත්වලට ඇතුළත් කර වාර්ෂිකව තුලනය කොට භාණ්ඩ සමීක්ෂණ පවත්වා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. පාසලේ සියලු නිවාඩු ලේඛන, ආචාර්ය මණ්ඩල රැස්වීම් වාර්තා, ගුරු කාර්ය සාධන වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය.

2.24 සාමාන්‍ය රජයේ ගුරුවරුන්ට හිමි කෙටි නිවාඩු, වරු නිවාඩු සහ වෙනත් නිවාඩු උපකෘත පාසල්වල ගුරුවරුන්ට ද එලෙසින් ම බලපැවැත්වේ. (ආයතන සංග්‍රහයේ සහ ඊට ආනුෂංගික චක්‍රලේඛ උපකෘත විශේෂ පාසල්වල ගුරුභවතුන්ට ද අදාළ වේ.)

2.25 පාසලේ ශිෂ්‍ය පැමිණීමේ සමාන්‍ය ගණන 5:1 අනුපාතයට අනුව ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගත්, අවම වසරක ස්වේච්ඡා සේවා කාලයක් සම්පූර්ණ කළ සුදුසුකම් සහිත ගුරුභවතුන්ට විධිමත් පත්වීම් ලිපි ලබාගැනීම සඳහා විදුහල්පති විසින්, කළමනාකරු මගින්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව අධ්‍යාපන අමාත්‍යාංශය වෙතට නාම යෝජනා ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. සමාන්‍ය පෙළ ගණිතය හා මව් භාෂාව ඇතුළු විෂයන් 3ට සම්මාන සාමාර්ථ සහිතව අවම විෂයන් 6ක් සමත් සහ බඳවා ගැනීමට යෝජිත විෂය සහිතව අ.පො.ස. උසස් පෙළ විෂයන් 3ක් සමත් වී තිබිය යුතු ය. තාක්ෂණික විෂය සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ දී අ.පො.ස. උසස් පෙළ විෂයන් 3ක් සමත්වීම (අවම තාක්ෂණික විෂය සමඟ) හෝ ජාතික වෘත්තිය කුසලතා මට්ටම 4 (NVQ 4) / ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් සහිත විය යුතු ය.

2.26 අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කරන ලද 37/2020, 33/2022, 01/2023, 02/2024 චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකොට වාර්තා පවත්වාගත යුතු ය.



CamScanner

## 4.0 උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය

4.1 උපකෘත විශේෂ පාසල් මගින් සකස්කර ඉදිරිපත් කරන පස් අවුරුදු සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම්, වාර්ෂික ලිත, පාසලේ කාලසටහන අනුමත කළ යුතු ය.

4.2 උපකෘත විශේෂ පාසලේ කළමනාකරු තනතුර සඳහා පාලක සභාව විසින් කරනු ලබන නාම යෝජනා පරීක්ෂා කර නිර්දේශ කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

4.3 කළමනාකරු විසින් යෝජනා කරනු ලබන ස්වේච්ඡා ගුරු පත්වීම් පරීක්ෂා කර අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නිර්දේශ කර ඉදිරිපත් කිරීම සිදුකළ යුතු ය. ඒ සඳහා ස්වේච්ඡා ගුරුවරයකු ලෙස අවම වර්ෂයක සාර්ථක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීමත් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීමත් සහ එම පාසලේ පුරප්පාඩු පැවතීමත් අත්‍යවශ්‍ය වේ.

4.4 විදුහල්පති තනතුර සඳහා කළමනාකරු විසින් යෝජනා කරනු ලබන නාම යෝජනාව අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය සඳහා නිර්දේශ කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයට ඉදිරිපත් කිරීම කළ යුතු ය. අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විදුහල්පති පත්වීම් ලිපිය නිකුත් කරනු ලබන අතර ඊට අදාළ ලිපි ගොනුව පවත්වාගෙන යාම කළ යුතු ය. එම විදුහල්පති සම්බන්ධයෙන් ආයතන කටයුතු, විදුහල්පතිවරුන්ගේ උසස් වීම, විශ්‍රාම ගැන්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

4.5 කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පවත්වන විදුහල්පති රැස්වීම් සඳහා උපකෘත පාසල්වල විදුහල්පතිවරුන් සහභාගි කරගැනීම, විදුහල්පති පුහුණු, ගුරු පුහුණු සහ ගුරු සේවයේ කාර්යක්ෂම කඩයිම්වලට අදාළ පුහුණු සඳහා කැඳවීම සිදුකළ යුතු ය.

4.6 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දීම සඳහා කටයුතු කිරීම, දිවා ආහාර සඳහා අවශ්‍ය කටයුතු සහ ප්‍රතිපාදන ලබාදීම, අධ්‍යාපන චාරිකා සඳහා අනුමැතිය ලබා දීම, සිදු කළ යුතු ය.

4.7 අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරුවරුන් සඳහා වියිමත් පත්වීමේ ලිපිය නිකුත් කළ යුතු අතර එතැන් සිට ගුරුභවතුන් සම්බන්ධයෙන් පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම කළ යුතු ය. එම ගුරුභවතුන් සම්බන්ධයෙන් ආයතන කටයුතු, ගුරු භවතුන්ගේ ශ්‍රේණි උසස් වීම, විශ්‍රාම ගැන්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

4.8 අධ්‍යාපන අමාත්‍යාංශ අංක 31/2014 චක්‍රලේඛය අනුව උපකෘත විශේෂ පාසල් නියාමනය සහ විෂය අධ්‍යක්ෂවරු මගින් පාසල් ක්ෂේත්‍ර අධීක්ෂණය ද සිදු කළ යුතු ය.

## 5.0 උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යභාරය

5.1 උපකෘත විශේෂ පාසල්හි කළමනාකරු තනතුරු සඳහා පාසල් කළමනාකරු විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරනු ලබන [illegible] අයදුම්පත් පරීක්ෂා කර නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළ යුතු ය.

5.2 පාසලේ විදුහල්පති තනතුර සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍රය පළාත් අධ්‍යක්ෂ විසින් නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.



CS CamScanner